// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2376/03 - 2024 මාර්තු මස 18 වැනි සඳුදා - 2024.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: MUL/LND/02/ACQ/24.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/4/2013/ඩී/520.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම*/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ*/පරවශතාවේ විස්තර.*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නෙරලම්පිටිය ග්‍රාම නිලධාරි වසමට අයත් මුලටියන හා නෙරලම්පිටිය ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2023.12.27 දිනැති පිඹුරු අංක ක.සි. 820414 හි කලාප අංක 04, පත්‍ර අංක 1හි කැබලි අංක 1, 2 හා 3 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.8820 ක් වූ පහත සඳහන් ඉඩම්.

**කැබලි අංක 01**
ඉඩමේ නම: දිද්දෙණිපොත වත්ත ගල්කඩුව කොටස; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, වැසිකිලියක් සහ තේ කුරුඳු සහිත ළඳු කැලයක් ඇත; හිමිකම් පාන්නා: මතුරට වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්. 1.7235.

**කැබලි අංක 02**
ඉඩමේ නම: දන්ගලගේවත්ත; ඉඩමේ විස්තරය: හේන, තේ සහ කුරුඳු සහිත මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් පාන්නා: ජේ. ජේ. අබේගුණවර්ධන; ප්‍රමාණය: හෙක්. 0.1376.

**කැබලි අංක 03**
ඉඩමේ නම: දන්ගලගෙවත්ත; ඉඩමේ විස්තරය: ළඳු කැලය; හිමිකම් පාන්නා: ජේ. ජේ. අබේගුණවර්ධන; ප්‍රමාණය: හෙක්. 0.0209.

ඉහත සඳහන් ඉඩමට*/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජුනි මස 05 වැනි දින පෙ.ව. 10.00 ට මුලටියන ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2024 මැයි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම*/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,**
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2024 මාර්තු මස 11 දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0139


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*